**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2023**

**-----------------------------------------------------------------------**

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 99 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් ගොඩනැංවීම මඟින් ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් යළි නගා සිටුවීම, මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහල නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 4,060 කට සමාන ජපන් යෙන් මිලියන 3,191 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘති කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2024 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

වඩා හොඳ සනීපාරක්ෂක පහසුකම් තුළින් මහවැලි ගඟේ ජීවන පරිසරය සහ ජල තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රධාන කොටස් 05ක් යටතේ ක්‍රියාත්මක කර ඇත, එනම් උපදේශන, අපජල පවිත්‍රාගාරය (පොම්පාගාරය, පීඩන අපවහන පද්ධතිය, අපජලය ඉවතලන මාර්ගය, රොන් මඩ වියළන පහසුකම) අපජලය එකතු කිරීමේ පද්ධතිය, මැන්හෝල් පොම්පාගාරය, ජනාකීර්ණ ප්‍රදේශවල දේපල සම්බන්ධතා පහසුකම්.

**2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| ව්‍යාපෘති සංරචකය | 2023 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනයේ ප්‍රතිශතය | ළඟාකරගෙන ඇති කාර්ය සාධනයේ ප්‍රතිශතය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| පැකේජය 3- දේපල සම්බන්ධතා | 100 | 64 | මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘතියේ මෙම කොටස **2017** වන විට අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, වසර හයකට වඩා වැඩි ප්‍රමාදයකින් පසුව සියයට **64** ක භෞතික ප්‍රගතියක් සහිතව කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලදී. මෙම කොන්ත්‍රාත්තුව දේපල සම්බන්ධතා **11,700**ක් ලබා දීමට සැලසුම් කර තිබූ නමුත් **2023** දෙසැම්බර් **31** වන විට අපවහන ජාලයට සම්බන්ධ දේපල **4,088**ක් පමණක් සම්බන්ධ කර තිබුණි. | රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ණය නොගෙවීමට රජය ගත් තීරණය හේතුවෙන් ජයිකා ආයතනය 2022 මාර්තු මාසයේ සිට කොන්ත්‍රාත්කරුවන්ට බිල්පත් ගෙවීම අත්හිටුවා ඇත. | සැලසුම් කළ කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කළ යුතුය. |

**3. කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුගේ හිමිකම් ඉල්ලීම් 1 සහ 2 යටතේ ආශ්‍රිත පිරිවැය සහ කාලය දීර්ඝ කිරීම් සඳහා ඉල්ලීම් කර තිබූ නමුත් මේ සඳහා ව්‍යාපෘති ඉංජිනේරුවරයා එකඟ වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, හිමිකම් අංක 1 සහ අංක 2 ආරවුල් විනිශ්චය මණ්ඩලය (DAB) වෙත යොමු කර තිබූ අතර සේවායෝජකයා විසින් ආරවුල් විනිශ්චය මණ්ඩලය ලබා දුන් තීරණය පිළි නොගෙන ඒ සඳහා එකඟ නොවීමේ නිවේදනය නිකුත් කර තිබුණි. අනතුරුව 2020 ජුනි මාසයේදී සාමූහික එකඟතා විසඳුමක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබූ අතර කොන්ත්‍රාත්කරුගේ හිමිකම් වටිනාකම ලෙස කොන්ත්‍රාත්කරු රු. මිලියන 1,745.20 ක් සහ රු. මිලියන 1,304.69 ක්ද, ඉංජිනේරු නියෝජිතයා රු. මිලියන 89.36 ක්ද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය රු. මිලියන 791.12 ක් සහ රු. මිලියන 1,138.31 ක්ද යෝජනා කර තිබිණි. මෙම විවිධ වටිනාකම් යෝජනා කර තිබුණද එහි නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය හෝ වලංගුභාවය විධිමත් ලෙස තහවුරු නොකර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රු. මිලියන 1,304.69ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට නිර්දේශ කර තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව කැබිනට් ටෙන්ඩර් මණ්ඩලය හරහා ප්‍රදානය කර ඇති බැවින්, විචලනයන් සඳහා අනුමැතිය ලබාගැනීමට 2021 දෙසැම්බර් 29 වන දින ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. | කොන්ත්‍රාත්කරුට කිසියම් ගෙවීමක් කිරීමට පෙර මණ්ඩලයේ විචලන කමිටුවක් සහ අමාත්‍යාංශ විචලන කමිටුවක් මඟින් වටිනාකමේ නිරවද්‍යතාව තහවුරු කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ආ) | මලාපවහන ජාලයේ ස්ථාන 48 ක දිග මීටර් 1,855 ප්‍රදේශයක නල පද්ධතියේ නල ගිලා බැසීම් සිදුව තිබුණි. මෙහි ස්ථාන 38ක් ඇතුළුව මීටර් 1,520ක් වසර 2ක් පුරාවට වරින් වර සේදීම අවශ්‍ය බවට හඳුනාගෙන ඇති අතර, ස්ථාන 8ක් ඇතුළුව මීටර් 299ක් සෑම මාස 6කට වරක් අඛණ්ඩව වසර 100ක කාලයක් සේදීම අවශ්‍ය වන අතර ස්ථාන 2ක් ඇතුළුව මීටර් 36ක නල පද්ධතිය නැවත වරක් ඉදිකිරීම සඳහාත් කමිටු නිර්දේශ ලබාදී තිබුණි. කමිටු වාර්තාවට අනුව ප්‍රමාණවත් නොවන බිම් සැකසුම, ප්‍රමාණවත් නොවන සංයුක්ත කිරීම, තත්වයෙන් බාල අමුද්‍රව්‍ය භාවිතය, නැවන පිරවුම් සඳහා සුදුසු නොවන ක්‍රමවේද යොදගැනීම, නල විධිමත්ව සම්බන්ධ නොකිරීම හා දිගුකාලීන අයහපත් කාලගුණික තත්වයන් නල ගිලා බැසීමට හේතු වී තිබුණි. ඒ අනුව නල ගිලාබැසීම් සඳහා කොන්ත්‍රාත්කරුගේ දෝෂයන් හා ව්‍යාපෘති කළමණාකරණ අංශයේ නිසි අධීක්ෂණයක් නොවීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් නල ගිලා බැසීමේ දෝෂ තත්වය සඳහා කොන්ත්‍රාත්කරුගෙන් අයකරගැනීමට තීරණය කර තිබූ රු.මි. 58 ක මුදල සම්බන්දයෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය සහ පැකේජ 2 කොන්ත්‍රාත්කරු අතර ලිඛිත එකඟතාවයකට හෝ අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි. | අවසන් බිල්පත තවමත් ගෙවා නොමැති බැවින්, නල ගිලා බැසීම හේතුවෙන් කාලීනව නළ සේදීම සහ නල නැවත එලීම් කිරීම සඳහා වූ පිරිවැය වෙනුවෙන් පැකේජ 2 කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමට අවශ්‍ය නොවන බව දන්වා සිටී. | ව්‍යාපෘතිය වසා දැමීමට පෙර සියලු දෝෂ නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 4. බාහිර ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2024 මාර්තු 31 දින වන විටත් පැකේජ 3 කොන්ත්‍රාත්තුව අවසන් වී නොතිබීම හේතුවෙන් පරිශ්‍රයෙන් අපවිත්‍ර වූ ජලය මහවැලි ගඟට, මැද ඇලට සහ නුවර වැවට සෘජුවම මුදා හැරීමෙන් දැඩි පරිසර දූෂණයක් ඇති කරන බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්තුව තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් දේපල සම්බන්ධතා ලබා දිය නොගැනීමෙන් මෙම තත්වය උද්ගත වී ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂ 2019 දී රු.මිලියන 39 ක ව්‍යාපෘති අරමුදල් භාවිතා කරමින් ක්‍රීඩා උපයෝගිතා වාහනයක් ලෙස වර්ගීකරණය කරන ලද ලැන්ඩ් ක්‍රෲසර් ප්‍රාඩෝ වර්ගයේ සුඛෝපභෝගී ජීප් රථයක් මිලදීගෙන තිබුණි. මෙම වාහනය ආනයනය කළ දා සිට ව්‍යාපෘති කටයුතු සඳහා භාවිත කර නොතිබූ අතර මුලදී රේඛීය අමාත්‍යාංශයේ ඇමැති කාර්ය මණ්ඩලය සඳහා එය භාවිතා කර 2023 ජනවාරි 19 වනදා සිට එම වාහනය වෙනත් අමාත්‍යාංශයකට රැගෙන ගොස් තිබුණි. ඒ සම්බන්ධයෙන් කිහිප වතාවක්ම විගණනයෙන් වාර්තා කළ ද කළමනාකාරීත්වය විසින් වාහනය ආපසු ලබා ගැනීමට හෝ වාහනය අවභාවිතය වලක්වා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය විසින් ටොයෝටා SUV, WP CBG 7386 අංක දරණ රථය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දුන් අතර, 2019.06.04 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව රථය අමාත්‍යාංශයට පැවරීය. | ව්‍යාපෘති වත්කම් අවභාවිතය වළක්වා ගැනීමටත් හා මෙම වාහනය අවභාවිතය නිසා සිදුවූ සියලුම පාඩු වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**5.** **මතභේදයට තුඩුදෙන කරුණු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2024 ජුනි 22 වැනි දින වන විට ව්‍යාපෘතිය මගින් ඉඩම් අත්පත් කර ගැනීම/මිලදී ගැනීම ආරම්භ කර වසර 20ක් ගතවී ඇතත් ව්‍යාපෘති කටයුතු සඳහා යොදාගෙන තිබූ ඉඩම් 09න්, ඉඩම් 02ක් පමණක් නිරවුල් කර තිබුණි.. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර ඉඩම් අංශය මගින් ඉදිරිපත් කරනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි |
| (ආ) | 2023 ජුනි 22 දිනැති අංක LAND/CE/KAN/GEN/3833 ලිපිය මගින් ව්‍යාපෘතියට අදාළ ප්‍රධාන පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි වශයෙන් රුපියල් 3,277,825ක් තක්සේරු කර තිබුණද ඊට ඉඩම් හිමියන් එකඟ නොවීම හේතුවෙන් ඉඩම් හිමියන් විසින් වන්දි සමාලෝචන මණ්ඩලයට අභියාචනය ක් ඉදිරිපත් කර තිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර ඉඩම් අංශය මගින් ඉදිරිපත් කරනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි |